# 2
# ශ්‍රී මහා බෝධියේ ගිහි භාරකාරීත්වය හිමි නුවරවැව පවුල

ඊ.ඩබ්ලිව්.ඊ. හසිත චාමිකර ගුණසිංහ

---

**හැඳින්වීම**

දෙවනපැතිස් රජ දවස සංඝමිත්තා මෙහෙණිය විසින් මෙරටට වැඩම කරවන ලදුව අනුරාධපුර මහමෙවුනා උයනේ රෝපිත ශ්‍රී මහා බෝධීන් වහන්සේ, ලෝකවාසී බෞද්ධයන්ගේ නිරන්තර පුද පූජාවට පාත්‍රවන පූජනීය වස්තුවකි. මහනුවර ශ්‍රී දළදා මාළිගාවේ වැඩසිටින දළදා වහන්සේට පමණක් පූජනීයත්වයෙන් දෙවැනි වන ශ්‍රී මහා බෝධීන් වහන්සේ හා බැඳී පවතින සම්ප්‍රදායයන් රාශියකි. එහිදී දළදා වහන්සේට මෙන්ම ශ්‍රී මහා බෝධීන් වහන්සේට ද ගිහි භාරකාරයෙකු පත්කරනු ලැබීම විශේෂය. සීමාසහිත වූ ඡන්ද ක්‍රමයකින් පත්කරනු ලබන දළදා වහන්සේගේ ගිහි භාරකාර ධූරය උසුලන දියවඩන නිලමේවරයා පිළිබඳ බොහෝ දෙනා දනිතත්, අනාදිමත් කලක පටන් ශ්‍රී මහා බෝධිය ප්‍රධාන අටමස්ථානයේ ගිහි භාරකාරීත්වය පාරම්පරිකව උසුලන නුවරවැව පවුලේ ප්‍රධානියා පිළිබඳ එතරම් ප්‍රකට නොවේ. ඒ නිසා පාරම්පරිකව අටමස්ථානයේ ගිහි භාරකාරීත්වය උසුලනු ලබන නුවරවැව පවුල පිළිබඳ අධ්‍යයනය කිරීම මෙම ලිපියේ අරමුණයි.

**නුවරවැව පවුලේ ඉතිහාසය**

මහනුවර යුගයේදී ප්‍රකටවන නුවරවැව පවුලේ ඉතිහාසය පිළිබඳ සොයාබැලීමේදී එය අනුරාධපුර යුගය දක්වා දිවෙන බව කියැවේ. දුමින්දාගමනය සමග මෙරටට පැමිණි 'බෝධිගුත්ත' කුමරු නුවරවැව පවුලේ ආදි පුරුෂයා වශයෙන් පිළිගැනේ (කරුණානන්ද 2015:87). ධර්මාශෝක අධිරාජයා (ක්‍රි.පූ. 268-232) විසින් ජය ශ්‍රී මහා බෝධියේ දක්ෂිණ ශාඛාව සංඝමිත්තා මෙහෙණිය අත ලංකාවට වැඩම කරවීමේදී එහි ආරක්ෂාව පවරන ලද්දේ රාජ කුමාරවරුන් අට දෙනෙකු හටය. බෝධිගුත්ත, සුමිත්ත, චන්ද්‍රගුත්ත, දේවගුත්ත, ධර්මගුත්ත, සූරියගුත්ත, ගෝතම හා ජුතින්ධර නම් වූ එකී කුමාරවරු අධිරාජයාගේ මෙහෙසියක වූ ශාක්‍ය වංශික වේදිසා දේවියගේ

සොයුරන් වූ අතර ඉන් ප්‍රධානියා ලෙස සැලකෙන්නේ වැඩිමහල් බෝධිගුත්ත කුමරුය. දඹදිවෙන් පිටත්වීමට පෙරාතුව ධර්මාශෝක අධිරාජයා විසින් බෝධිගුත්ත කුමරු හට ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ භාරකාරීත්වය පවරමින්, එහි කටයුතු සඳහා අවශ්‍ය පිරිස හා උපකරණ ලබාදීම සිදුකරනු ලැබූ බව *බෝධිවංසය* දක්වයි (*සිංහල බෝධිවංසය* 1970:121).

ලක්දිවට පැමිණි ඔවුන්ව සාදරයෙන් පිළිගත් දෙවනපෑතිස් රජු (ක්‍රි.පූ. 250-210) ඔවුන් අධිරාජයාගේ ඥාතීන් බව දැන සතුටට පත්ව ශ්‍රී මහා බෝධිය හා සම්බන්ධ තනතුරු ප්‍රදානය කළබව කියැවේ. මෙහිදී සිදුවන්නට ඇත්තේ ධර්මාශෝක අධිරාජයා ඔවුනට පැවරූ වගකීම් දෙවනපෑතිස් රජුගේද පිළිගැනීමට ලක්වීම බව පෙනේ. ඒ යටතේ බෝධිගුත්ත කුමරුට හිමි වූ 'ජයමහලේනා' තනතුරට අදාළ රාජකාරිය වූයේ ශ්‍රී මහා බෝධියේ ආරක්ෂාව පිළිබඳ වගකීම දැරීමයි. මේ අවස්ථාවේදී බෝධිගුත්ත කුමරුට ඔටුණු පළඳවා ඇතු පිටින් නුවර පැදකුණු කරවීමට රජු කටයුතු කළේ තනතුරට අදාළව ගෞරවයක් ලබාදීමට විය හැකිය (*සිංහල බෝධිවංසය* 1970:127). ඉන් නොනැවතුණු රජු බෝධිගුත්ත කුමරුට සම කුල ස්ත්‍රියක් පාවාගැනීමට අවශ්‍ය උපකාර ලබාදීමටද ඉදිරිපත් වූයේ කුමරුගේ වංශය අඛණ්ඩව පවත්වාගෙන යාම පිණිස ය. බෝධිගුත්ත කුමරු සරණ පාවා ගත්තේ සිවුරු හරවන ලද **සුනන්දා** නම් සාමණේරියයි. ඇය සංඝමිත්තා මෙහෙණිය සමග වැඩම කළ ශාක්‍ය වංශික බෝධිමිත්තා නම් තෙරණියගේ නැගණිය වූවා ය. පසු කලෙක දෙවනපෑතිස් රජු විසින් එම දෙපළට දාව උපන් මහින්ද හා විධුරින්ද නම් කුමාරවරුන්ටද පිළිවෙලින් 'සුලුලිය මහලේනා' සහ 'ලක්දිව් පිරිසිදුනා' තනතුරු පිරිනැමූ බව *බෝධිවංසයේ* සඳහන් වේ (*සිංහල බෝධිවංසය* 1970:130). මේ හැරුණුවිට දෙවනපෑතිස් රජු විසින් සුමිත්ත කුමරුටද ජයමහලේනා තනතුර ප්‍රදානය කළ බව බෝධිවංසය දක්වන අතර මිහිඳු මහරහතන් වහන්සේගේද උපදෙස් පරිදි ශ්‍රී මහා බෝධියට පෙරහැර කරමින්, එහි සිරිත්විරිත් ආදිය පැවැත්වීම භාරවූයේ මෙකී ජයමහලේනාවරුන් දෙදෙනාටය (සිංහල බෝධිවංසය 1970:131).

එතැන් පටන් බෝධිගුත්ත පරපුරේ සාමාජිකයෝ ශ්‍රී මහා බෝධියේ ආරක්ෂාව පිළිබඳ වගකීම් නොපිරිහෙලා ඉටුකරන්නට වූහ. සුමිත්ත කුමරුටද මෙකී වගකීම පැවරුණද, වැඩිමහල් බෝධිගුත්ත කුමරුගේ පරපුර ඉස්මතු වූ බව පෙනේ. බෝධිගුත්ත පරපුර ක්ෂත්‍රියයන් වීමත්, බුදුන් උපන් ශාක්‍ය වංශයේ වීමත්, ධර්මාශෝක අධිරාජයාගේ ඥාතීන් වීමත් හේතුවෙන් ඔවුන්ට ලාංකේය සමාජයේ හිමිවන්නට ඇත්තේ ඉහළ පිළිගැනීමකි. එහි ප්‍රතිඵලය වූයේ පසුකලෙක ලක්දිව සිහසුනට පවා ඔවුන් පත්වීමයි.

බෝධිගුත්ත කුමරුට දාව සුනන්දා දේවියට උපන් දරු පරපුර පසුකලෙක 'මෙහෙණවර වංශය' නමින් ප්‍රකට වූ බව *රාජරත්නාකරය* දක්වන අතර (1995:128-129) ගම්පොළ රාජධානිය ආරම්භ කිරීම සඳහා මුල් වූ සේනාලංකාධිකාර අමාත්‍යවරයා මෙන්ම පසුකලෙක ගම්පොළ රජ පැමිණි වීරබාහු නම් ඈපාණන් මෙහෙණවර වංශිකයන් වූ බව *නිකාය සංග්‍රහය* දක්වයි (2008:80,86). අනුරාධපුර යුගයේදී 'ලමැණි' හෙවත් 'ලම්භකර්ණ' රාජවංශය ඇරඹෙන්නේ ශ්‍රී මහා බෝධිය සමග පැමිණි රාජ කුමාරවරුන්ගෙන් බවට මත පළවේ (Hettiarachchi 1994:69-70). එසේම ඔවුන්ට සම්බන්ධ 'මහබෝ වඩා ආ සිරිසඟබෝ වංශයෙන්' පැවත එන දඹදෙණියේ තුන්වන විජයබාහු (1232-1236) ආදී රජදරුවන් පිළිබඳ තොරතුරුද සාහිත්‍ය මූලාශ්‍රයතුළින් හමුවේ (*පූජාවලිය* 2009:785).

ගම්පොළ යුගයෙන් පසුව නිශ්චිතවම බෝධිගුත්ත පරපුරට සම්බන්ධ පිරිසක් පිළිබඳ තොරතුරු හමුවන්නේ මහනුවර යුගයේදීය. ඒ නුවරකලාවිය දිසාව තුළ ප්‍රාදේශීය නිලධාරීන් ලෙස කටයුතු කළ වන්නියා පවුලක් වූ 'නුවරවැව පවුල' ඊට උරුමකම් කීම හේතුවෙනි. අනුරාධපුර යුගයෙන් පසුව රාජධානිය නිරිතදිගට ව්‍යාප්ත වූ කාලවකවානුවේදී පරසතුරු උවදුරුවලට මුහුණු දෙමින්, ස්වකීය පරපුරේ උරුමය වූ ශ්‍රී මහා බෝධිය සුරක්ෂිත කිරීම බෝධිගුත්ත පරපුරේ සාමාජිකයන් විසින් ඉටුකරන්නට ඇත. එකී පරපුර මහනුවර අවධියේදී නුවරවැව පවුල නමින් හැඳින්වෙන්නට ඇත්තේ නුවරවැව ඔවුන්ගේ පාරම්පරික නිවහන පිහිටා තිබීම නිසා විය යුතුය. බෝධිගුත්ත කුමරු සූර්ය වංශික වූ හෙයින්දෝ නුවරවැව පවුලේ පෙළපත් නම ලෙස භාවිත වූයේ 'සූරියකුමාර වන්නිසිංහ' යන කොටසයි.

**උඩරට රාජධානි සමයේ නුවරවැව පවුල**

උඩරට රාජධානි සමයේදී තමන්කඩුව ප්‍රදේශය හැර යාපන රාජ්‍යයට දකුණින් හා මාතලේ හා සත් කෝරළය දිසාවන්ට උතුරෙන් පිහිටි මුළු ප්‍රදේශය අයත්වූයේ නුවරකලාවිය දිසාවටය. එහි දිසාවේවරයා අගනුවර නේවාසිකව සිටි හෙයින් පාලනය ගෙනයනු ලැබුවේ 'වන්නිවරු' නම් ප්‍රාදේශීය මුලාදෑනීන් විසිනි. දිසාවේවරයකු යටතේ සිටියද, වන්නිවරුන් දිසාවේ හා සමාන බලයක් ඉසිලූ බව පෙනීයන්නේ සීට්ටු නිකුත් කිරීමට බලය තිබීම සහ දඩ මුදල්වලින් කොටසක් හිමිවීම ආදී බලතල රැසක් ඔවුනට හිමි වූ හෙයිනි. මේ හැරුණුවිට රජුගෙන් ලද නින්දගම්ද වන්නිවරුන් යටතේ පැවති බව පෙනේ. වන්නිවරුන්ගේ ප්‍රධානියා ලෙස 'මහවන්නියා' කටයුතු කළ අතර එකී තනතුර පාරම්පරිකව හිමිව තිබුණේ නුවරවැව පවුලටය (විමලානන්ද 2010ආ:335).

අනුරාධපුර යුගයේ පටන් ශ්‍රී මහා බෝධියේ භාරකාරීත්වය ඉසිලීම හේතුකොටගෙන බෝධිගුත්ත පරපුරට හිමිව තිබූ තත්ත්වය පසුකලෙක ප්‍රදේශීය නායකත්වයට පත්වීමට උපකාර වන්නට ඇති බවත්, මහනුවර යුගයේදී එකී දේශපාලන ආධිපත්‍යය පිළිගැනීමේ ප්‍රතිඵලයක් වශයෙන් මහවන්නියා තනතුර එම පවුලට පැවරෙන්නට ඇති බවත් උක්කු බණ්ඩා කරුණානන්ද උපකල්පනය කරයි. කරුණානන්ද දක්වන අන්දමට එවකට එළිපෙහෙළි වී තිබූ සිද්ධස්ථානය වූ ශ්‍රී මහා බෝධියේ ගිහි භාරකාරීත්වය ඉසීලීම හේතුවෙන් ඔවුන්ට අටමස්ථානයේම ආරක්ෂාව භාරවන්නට ඇති අතර, අනුරාධපුර ග්‍රාමය ඔවුන්ගේ නින්දගමක් වීමද එයට බලපාන්නට ඇත (2007:111). මේ පසුබිම තුළශ්‍රී මහා බෝධීන් වහන්සේ වැඩසිටින බෝමළුව විහාරයේ නායක භික්ෂුව නොඑසේනම් අටමස්ථානාධිපති භික්ෂුව පත්කිරීමේ බලය පැවතියේද නුවරවැව පවුලේ ප්‍රධානියා සතුවය (කරුණානන්ද 2007:93-95).

ඉංග්‍රීසි පාලනය ඇරඹීමට පෙරාතුව මහවන්නියා ධූරය දැරූ නුවරවැව පවුලේ ප්‍රධානීන් පිළිබඳ තොරතුරු හමුවන්නේ කීර්ති ශ්‍රී රාජසිංහ රජ සමයේ (1747-1782) පටන්ය. කීර්ති ශ්‍රී රාජසිංහ සමයේ හරංකහවේ බුද්ධරක්ඛිත නම් භික්ෂූන් වහන්සේ රචිත ස්වකීය පිං පොතේ අනුරාධපුරයේ පූජනීය ස්ථානවලට කළ පුදපූජා පිළිබඳ දක්වන කොටසේ නුවරවැවේ මුදියන්සේට දන්වා එකී ස්ථානවලට එළඹි බව සඳහන් කරයි (හරංකහවේ බුද්ධරක්ඛිත ස්වාමීන්ගේ පිං පොත 2012:38). ශ්‍රී මහා බෝධිය වටා ඉදිකර තිබූ ප්‍රාකාරය ප්‍රතිසංස්කරණය කිරීමට වැඩම කළ ඉලිපන්ගමුවේ අත්ථදස්සී හිමියන්ටද අටමස්ථානයේ ගිහි භාරකාරීත්වය දැරූ නුවරවැව පවුලේ මහවන්නියාගේ සහයෝගය ලැබී තිබුණේ මේ කාලසීමාවේදීය. දෙවනපැතිස් රජ දවස ඉදිකොට තිබූ මෙම ප්‍රාකාරය අබලන් වීමෙන් අලි ඇතුන්ගේ ප්‍රහාරවලට මුහුණදීමට සිදුව තිබිණි. මේ පිළිබඳ කීර්ති ශ්‍රී රාජසිංහ රජු දැනුවත් කළ ඉලිපන්ගමුවේ අත්ථදස්සී හිමියන්ට රජු විසින් නුවරකලාවියේ දිසාවේ පදවිය පිරිනැමූ හෙයින් එකී බලතල යොදාගනිමින් මහවන්නියා ඇතුළු නුවරකලාවියේ මුලාදෑනීන්ගේ සහය මෙයට ලබාගැනීමට උන්වහන්සේ සමත්වූහ. අවට විසිරී පැවති නටබුන්වලින් එක්කරගත් ගල් කණුවලින් වර්තමානයේ පවා දැකිය හැකි ප්‍රාකරය උන්වහන්සේගේ උත්සහයේ ප්‍රතිඵලයකි (කරුණානන්ද 2007:28, ස්වර්ණසිංහ 2010:53-54).

රාජාධි රාජසිංහ (1782-1798) දවස රාජකීය සන්නසක් හිමි වූ නුවරවැවේ සූරියකුමාර වන්නිසිංහ මුදලියා පිළිබඳ කරුණු හමුවේ. එම සන්නසට අනුව ශක වර්ෂ 1715/ක්‍රිස්තු වර්ෂ 1793 දී රජු විසින් නුවරවැවේ සූරියකුමාර වන්නිසිංහ මුදලියාගේ රාජපාක්ෂික බව හා භක්තිය අගයමින් නුවරකලාවියේ නුවරගම් පළාත සන්නසකින් ප්‍රදානය කරනු ලැබ තිබේ (විමලානන්ද 2010ආ:335). අවසාන

වශයෙන් ශ්‍රී වික්‍රම රාජසිංහ රජ (1798-1815) දවස රාජ උදහසට පත්ව මන්නාරමට පලා ආ නුවරවැව සූරියකුමාරසිංහ මුදියන්සේ නම් මහවන්නියා පිළිබඳ කරුණු හමුවේ (කරුණානන්ද 2007:112). බොහෝ විට මෙම තිදෙනාම එක් අයෙකු විය හැකිය.

ශ්‍රී වික්‍රම රාජසිංහ රජුගේ උදහසට පත් මහවන්නියා පිළිබඳ ජනප්‍රවාදයක් ද නුවරකලාවියේ පවතී. රජුට බිසවක් ලෙස මදුරාවෙන් ගෙන්වූ කුමරියකගේ කේන්දරයට අනුව රජුට අපල විය හැකි බැවින් ඇය පෙරළා මදුරාපුරයට පිටත් කෙරුණු අතර ඇය ගමන් ගත්තේ නුවරකලාවිය හරහාය. ඇය පිළිබඳ සිතක් ඇතිකරගත් **නුවරවැව මුදියන්සේ** විසින් ඇය සරණ පාවාගනු ලැබුවේ රාජ උදහස පිළිබඳ පවා සැලකිල්ලක් නොදක්වමිනි. මේ පිළිබඳ සැලවීමෙන් අධික කෝපයට පත් රජු උඩැක්කියක් වයන සන්නාසියෙකුගේ වේශයෙන් පැමිණ මහවන්නියාගේ ගෙල සිඳලූ බව එකී ජනප්‍රවාදයෙන් දැක්වේ (පෙරේරා 2012). ඉංග්‍රීසි වාර්තාවලට අනුව රාජ උදහසට පත් මහවන්නියා මන්නාරමට පලාවිත් දිවි ගලවා ගත් බව දැක්වෙන හෙයින් ජනප්‍රවාදයේ අවසන් කොටස සාවද්‍ය බව පෙනේ. එසේම ජනප්‍රවාදයේ මුල් කොටසේ නිරවද්‍යබව පිළිබඳවද වැඩියමක් කිව නොහැක්කේ ඒ පිළිබඳ වෙනත් මූලාශ්‍රයකින් කරුණු හමුනොවන හෙයිනි.

### ඉංග්‍රීසි පාලන සමයේ නුවරවැව පවුල

රාජ උදහසට පත්ව මන්නාරමට පලා ගිය මහවන්නියා ධූරය දරූ නුවරවැව පවුලේ ප්‍රධානියා නැවතත් එකී ධූරයේම පිහිටවනු ලැබුවේ ඉංග්‍රීසි පාලනය ඇරඹීමත් සමගය (කරුණානන්ද 2007:112). එවකට උඩරට රෙසිඩන්ට්වරයා වූ ජෝන් ඩොයිලිගේ සටහනකට අනුව ඔහුව **බුලංකුලමේ වන්නියා** යනුවෙන්ද හඳුන්වා තිබේ. ඔහුගේ අර්ධ සොහොයුරෙකු (වෙනත් මවකගේ දරුවෙකු) වූ **නුවරවැවේ කුඩා මුදියන්සේ** ශ්‍රී වික්‍රම රාජසිංහ රජුගේ අවසන් කාලසීමාවේදී සිරගත කොට සිටි බවත්, බ්‍රිතාන්‍යයන් පැමිණීමෙන් පසු ඔහුව නිදහස් කෙරුණු බවත් දැක්වේ. තමා සහ තමාගේ සොහොයුරා අතර නුවරවැව පත්තුව බෙදා දෙන ලෙස ඔහු විසින් ඉල්ලීමක් කරනු ලැබූ බව ද ඩොයිලි සඳහන් කරයි (*D'Oyly's Diary*, 1917:264-265). එහෙත් එය විසඳන ලද ආකාරය පිළිබඳ සඳහනක් නොමැත. ඉංග්‍රීසි පාලනය යටතේ ඉදිරියටත් නුවරකලාවියේ මහවන්නියා වශයෙන් නුවරවැව මුදියන්සේ කටයුතු කළ බව පෙනේ.

ඉංග්‍රීසි පාලනයට එරෙහිව වර්ෂ 1817-1818 කාලසීමාවේදී උඩරට ප්‍රදේශවල පැතිර ගිය ඉංග්‍රීසි විරෝධී අරගලය සඳහා මහවන්නියාගේ සහයෝගයද හිමි වූ බව කියැවේ (කරුණානන්ද 2007:112). එහිදී රාජප්‍රතිරූපකයා වශයෙන් පෙනීසිටි විල්බාවේගේ රැකවරණය උදෙසා ප්‍රමාණවත් දායකත්වයක් ලැබී තිබුණේ

මහවන්නියාගෙනි (විමලානන්ද 2010අ:358). නොසිතූ අන්දමින් අරගලය බිඳ වැටීමත් සමග සැඟවුණු මහවන්නියා වර්ෂ 1818 අගභාගයේදී පමණ අත්අඩංගුවට ගැනීමට ඉංග්‍රීසීහු සමත්වූහ (විමලානන්ද 2010අ:353). රාජද්‍රෝහීවීමේ වරදට තනතුරින් පහ කෙරුණු මහවන්නියා ගාල්ලේ සිරගත කොට තැබිණි (කරුණානන්ද 2007:112-113).

මේ කාලසීමාවේදී මහවන්නියාගේ මව විසින් ඒජන්ත වෙත ඉදිරිපත් කරනු ලැබූ පෙත්සමකින් දන්වා සිටියේ තම පුත්‍රයා ගාල්ලේ සිරගතව සිටින හෙයින් පවුල් ඉඩකඩම් පවත්වාගෙන යාම අපහසු වී වනසතුන්ගෙන් හානි පැමිණ ඇති බවත්, වැව් අමුණු පිළිසකර කිරීම් අතපසු වී ඇති හෙයින් වගා කටයුතු අඩපණ වී ඇති බවත්ය. එපමණක් නොව පවුලේ උරුමයක් ලෙස අටමස්ථානයේ ගිහි භාරකාරීත්වය දරන තම පුත්‍රයා නොමැතිවීමෙන් ඒවායේ නඩත්තුව අඩපණ වී ඇති බව වැඩිදුරටත් මහවන්නියාගේ මව සඳහන් කර ඇත. මෙනිසා මහවන්නියාගේ නිදහස ලැබීම ඉක්මන් වූ බව ෆෝබ්ස් සඳහන් කරයි (Forbes, 1841:228-229).

වර්ෂ 1830 දී පමණ නිදහස ලද ඔහුව නැවත වරක් මහවන්නියා තනතුරේ පිහිටුවීමට ඉංග්‍රීසි බලධාරීන් කාරුණික වූ බව පෙනේ (කරුණානන්ද 2007:112). එයට හේතුවන්නට ඇත්තේ නුවරකලාවියේ ප්‍රදේශය තුළ පාරම්පරිකව නුවරවැව පවුල හිමිකරගෙන තිබූ නායකත්වය යටපත් කිරීමට ඉංග්‍රීසීන්ට නොහැකිවීම විය යුතු ය. නැවත තනතුරේ පිහිටවනු ලැබූ මහවන්නියා ඉංග්‍රීසීන් කෙරෙහි තම පක්ෂපාතීත්වය පළ කරමින් වර්ෂ 1830 මාර්තු 23 වනදා රාජ ප්‍රතිරූපකයා වශයෙන් පෙනී සිටි විල්බාවේ අත්අඩංගුවට ගැනීමට ද සමත්විය. කැරැල්ල බිඳවැටීමෙන් පසුව කලාගම් තුලානේ දලුදොඹ නම් ග්‍රාමයේ සැඟව සිටි විල්බාවේ අල්ලාගැනීම වෙනුවෙන් ඉංග්‍රීසි රජයෙන් මහවන්නියාට ත්‍යාගයක්ද හිමිවිණි (විමලානන්ද 2010:396). වර්ෂ 1836 හෝ 1837 දී මහවන්නියා මියගිය හෙයින් නුවරවැව පවුලේ ප්‍රධානත්වය හිමිවූයේ ඔහුගේ පුත් තරුණ **නුවරවැව බංඩාටය** (කරුණානන්ද 2007:112, Forbes 1841:229-230). එහෙත් ඒ සමග නුවරවැව පවුලේ උරුමය පිළිබඳ අර්බුද රාශියක් ඇති වූ බව පෙනේ.


**නුවරවැව පවුලේ උරුමය පිළිබඳ අර්බුදය**

නුවරවැව පවුලේ උරුමය පිළිබඳ පළමුවරට අර්බුදකාරී තත්ත්වයක් ඇතිවීමට හේතුවූයේ මියගිය මහවන්නියාට බිරින්දෑවරුන් දෙදෙනෙකුගෙන් ලැබුණු දරුවන් දෙදෙනෙකු සිටීමයි. වර්ෂ 1830 දී පමණ මහවන්නියා නිදහස ලැබී ආපසු පැමිණීමෙන් පසුව ඔහුගේ නීත්‍යානුකූල බිරිඳට දාව පුත්‍රයෙකු උපන් අතර නුවරවැව බංඩා නමින් නම් තැබිණි (කරුණානන්ද 2007:112). එහෙත් ඔහු

උපන්නේ වර්ෂ 1809 දී බව නුවරවැව බංඩාගේ සමාධියේ සමරු ඵලකයේ සටහන්කොට තිබේ (ඡායාරූපය 6). 1840 දශකයේ අගභාගයේ අනුරාධපුරයට පැමිණි ඉංග්‍රීසි නිලධාරියෙකු වූ එමර්සන් ටෙනන්ට් දක්වන්නේ නුවරවැව පවුලේ උරුමකරු යෞවන වියේ පසු වූ පිරිමි දරුවෙකු බවයි (Tennent 1860:625). ඒ පිළිබඳ එළඹිය හැකි නිගමනය වන්නේ නුවරවැව බංඩාගේ සමාධියේ ඇති සමරු ඵලකයේ කිසියම් දෝෂයක් ඇති බවයි.

වර්ෂ 1818 ඉංග්‍රීසි විරෝධී අරගලය සඳහා සම්බන්ධවීමේ වරදට ගාල්ලේ සිරගතව සිටි මහවන්නියා එහි සිරගතව සිටි උඩරට රදළයකුගේ දියණියක වූ **හක්කිඳ කුමාරිහාමි** සමග වාසය කළ හෙයින් ඔහුට දාව ඇයට දියණියක් උපන්නාය. **පුංචිමැණිකා** යන නම් ලද ඇය, මහවන්නියා නිදහස ලැබී නැවත අනුරාධපුරයට යන ගමනට ද එක්වූවාය. පුංචිමැණිකා දියණියක වශයෙන් නුවරවැව වලව්වේ හදා වඩා ගැනීමට මහවන්නියාගේ පළමු බිරිඳගෙන් (නීත්‍යානුකූල බිරිඳ) විරෝධයක්ද නොපළවිණි (කරුණානන්ද 2007:112-113). නිසි වයස් එළඹීමෙන් බින්න විවාහයකට එළඹි පුංචිමැණිකා සිය ස්වාමියා සමග වාසය කළේ දායාද වශයෙන් හිමිවුණු නුවරවැව පවුලේ පාරම්පරික නිවහන වූ නුවරවැව වලව්වේය. මෙයට අමතරව ඇයට මියගිය මහවන්නියාගේ ඉඩම්වලින් 1/3 ක් සහ ස්වර්ණාභරණ කොටසක් දායාදය වශයෙන් මහවන්නියාගේ වැන්දඹුවගෙන් තෑගි ඔප්පුවකින් හිමිවූයේ වර්ෂ 1850 අගෝස්තු 31 වනදාය. එහි නුවරවැව පවුලට පුංචිමැණිකාගේ ඇති සම්බන්ධය දක්වන්නේ'මහවන්නියාට දාව හක්කිඳ කුමාරිහාමි නම් දෙවන බිරිඳට උපන් දියණිය' යනුවෙනි (කරුණානන්ද 2007:113).

නුවරවැව වලව්ව පුංචිමැණිකාට පැවරීමෙන් පසු මහවන්නියාගේ වැන්දඹුව හා නුවරවැව බංඩාගේ නිවහන බවට පත්වූයේ නුවරවැව පවුලට අයත් බූලංකුලම වලව්වයි (ඡායාරූපය 1). එහි වාසයට පැමිණීමත් සමග නුවරවැව බංඩා 'බූලංකුලමේ නුවරවැව බංඩා/ නුවරවැව බූලංකුලමේ බංඩා' නමින්ද හඳුන්වා තිබේ (ඡායාරූපය 3). මේ කාලසීමාවේදී අනුරපුරයේ



ඡායාරූපය 1 : බූලංකුලම වලව්වේ පැරණි ඡායාරූපයක්
http://www.srilankaheritages.com/heritage-balankulame.html


සංචාරයකට පැමිණි එමර්සන් ටෙනන්ට්ගේ වාර්තාවේ දක්වෙන අන්දමට නැවත පිටත්වීමට පෙර මහාවිහාරයේ භික්ෂූන් වහන්සේලා විසින් ඔහුව කැඳවාගෙන යනු ලැබුවේ ශ්‍රී මහා බෝධිය සමග මෙරටට පැමිණි පරපුරේ පාරම්පරික උරුමකරුවා හමුවීමට ය. තරුණයෙකු වූ ඔහු **සූරියකුමාරසිංහ** යන නාමය දරූ බවත්, මේ ප්‍රදේශයේ අධිපතිත්වය අනාදිමත් කලක පටන් එම පවුල යටතේ පැවති බවත් ටෙනන්ට් සඳහන් කරයි (Tennent 1860:625).

තිසි වයස් එළඹීමෙන් පසු නුවරවැව බංඩා විසින් **ඕවිල්ලේ කුමාරිහාමි** නම් කුල කාන්තාව විවාහ කරගනු ලැබීය (කරුණානන්ද 2015:93). පසුව නුවරවැව පවුලේ උරුමය පිළිබඳ අර්බුදයක් ඇතිවන්නේ නුවරවැව වලව්වේ විසූ පුංචිමැණිකා සහ බුලංකුලම වලව්වේ විසූ නුවරවැව බංඩා අතරය. මියගිය නුවරවැව මහවන්නියාගේ ඉඩම් සහ නුවරවැව පවුලේ ප්‍රධානියා ලෙස භුක්ති විඳි වරප්‍රසාද පුංචිමැණිකාට පවරාදෙන ලෙස ඉල්ලමින් ඇගේ ස්වාමියා විසින් වර්ෂ 1851 දී අනුරාධපුර දිස්ත්‍රික් උසාවියේ නඩු පවරන ලදී. කරුණු සලකා බැලූ උසාවියේ තීන්දුව වූයේ මහවන්නියාගේ නීත්‍යානුකූල බිරිඳගේ (පළමු බිරිඳ) පුත්‍රයා වූ තරුණ නුවරවැව බංඩාට නුවරවැව පවුලේ සියලු අයිතිවාසිකම් හිමිවන බවයි (කරුණානන්ද 2007:113).

මීළඟට වර්ෂ 1853 දී අනුරාධපුර දිස්ත්‍රික් උසාවියක පවරනු ලැබූ නඩුවක තීන්දුව වශයෙන් ප්‍රකාශයට පත්කෙරුණේ අටමස්ථානය සම්බන්ධයෙන් මියගිය මහවන්නියා භුක්ති විඳි සියලු වරප්‍රසාද හා අයිතිවාසිකම්වල අයිතිය ඔහුගේ නීත්‍යානුකූල බිරිඳගේ (පළමු බිරිඳ) පුත්‍රයා වන නුවරවැව බංඩාට හිමි බවයි (කරුණානන්ද 2007:113). සම්ප්‍රදායානුකූලව නුවරවැව පවුලේ ප්‍රධානියාට අටමස්ථානයේ ගිහි භාරකාරීත්වය පැවරෙන හෙයින් නුවරවැව පවුලේ ප්‍රධානියා ලෙස නීත්‍යානුකූලව පිළිගැනුණු නුවරවැව බංඩාට එකී වරප්‍රසාද හා අයිතිවාසිකම් හිමිවීම නිවැරදිය.


කන්ද උඩරට රාජධානි සමය තුළ පැවති නීති ව්‍යවහාරය පාදක කොටගෙන සම්පාදිත *නීති නිඝණ්ඩුවට* අනුව සලකා බැලීමේදී ද පුංචිමැණිකාට සාධාරණ අන්දමින් දේපල බෙදා තිබෙන බව පෙනේ. උඩරට නීතියට අනුව යම් පුරුෂයෙකු විවාහ දෙකක් කරගනී නම් එක් බිරිඳකගෙන් පුතෙකුද, අනෙක් බිරිඳගෙන් දියණියකද ලැබුවේ නම් ඔහුගේ මරණින් පසු ඔහුගේ දේපල සමව කොටස් දෙකකට බෙදා දරුවන්ට උරුම වේ (නීති නිඝණ්ඩුව 2009:143). සම කුලයේ දරුවෙකු දරුකමට හදා වඩාගෙන එම දරුවා තමාගේ බව ලොවට ප්‍රකාශ කරන්නේ නම්, එම දරුවාට තමා හදා වඩාගත් දෙමාපියන්ගේ මරණයෙන් පසුව ඔවුන්ගේ ඉඩකඩම් අයත් වේ (නීති නිඝණ්ඩුව 2009:103). ඒ අනුව බැලීමේදී

මියගිය මහ වන්නියාගේ දෙවැනි බිරිඳගේ දරුවා වශයෙන්ද, පළමු බිරිඳ විසින් හදාවඩාගනු ලැබූ දරුවා වශයෙන්ද පුංචි මැණිකාට මියගිය මහවන්නියාගේ දේපළ සඳහා නුවරවැව බංඩාට හා සමාන හිමිකමක් ලැබේ. මියගිය මහවන්නියාගේ දේපළවලට උරුමකරුවන් වන නුවරවැව බංඩාට සහ පුංචිමැණිකාට අමතරව මහවන්නියාගේ වැන්දඹු බිරිඳද ජීවත්ව සිටින හෙයින් ඇයගේ නඩත්තුවටද කොටසක් වශයෙන් මහවන්නියාගේ ඉඩම් කොටස් තුනකට බෙදීම සාධාරණය. එපමණක් නොව ස්වර්ණාභරණවලින් කොටසක් මෙන්ම නුවරවැව පවුලේ පාරම්පරික නිවහන වූ නුවරවැව වලව්වේ හිමිකාරීත්වයද පුංචිමැණිකාට හිමිවීම මත ඇයට කිසිදු අසාධාරණයක් සිදුකර නොමැති බව පැහැදිලිය. එහෙත් ඇයට නුවරවැව පවුලේ ප්‍රධානත්වයට හිමිකම් කිව නොහැක්කේ මියගිය මහවන්නියාගේ පළමු බිරිඳගේ පුත්‍රයා වූ නුවරවැව බංඩා ජීවත්ව සිටින හෙයිනි.



ඡායාරූපය 2 : රුවන්මැලිසෑය අසළ, නුවරවැව බංඩාගේ සමාධිය
https://www.facebook.com/TheBulankulameFamily/

නුවරවැව බංඩා වර්ෂ 1861 දී අපුත්‍රකව මියයාමත් සමග නුවරවැව පවුලේ උරුමය පිළිබඳ ඇතිවූයේ අර්බුදකාරී තත්ත්වයකි. මෙනිසා වර්ෂ 1861 දී අනුරාධපුර දිස්ත්‍රික් උසාවියේ පවරනු ලැබූ නඩුවකින් තීන්දු වූයේ මියගිය නුවරවැව බංඩා සතු දේපල, වගකීම් සහ අයිතිවාසිකම් ඔහුගේ මව වූ මියගිය මහවන්නියාගේ වැන්දඹු බිරිඳට හිමිවන බවයි. අනතුරුව ඇය මියයාමෙන් පසු ඇගේ අන්තිම කැමති පත්‍රයට අනුව අනුරාධපුර දිස්ත්‍රික්



ඡායාරූපය 3 : නුවරවැව බංඩාගේ සමාධියේ ඇති ඵලකය
https://www.facebook.com/TheBulankulameFamily/

උසාවිය මගින් වර්ෂ 1861 දී තීරණය කරනු ලැබුවේ නුවරවැව පවුල සතු ඉඩකඩම්, වගකීම් හා අයිතිවාසිකම් මියගිය නුවරවැව බංඩාගේ වැන්දඹු බිරිඳ වූ ඕවිල්ලේ කුමාරිහාමිට හිමිවන බවයි. එහෙත් නුවරවැව පවුලේ උරුමය පිළිබඳ අර්බුදය නිසියාකාරව විසඳුනු බවක් නොපෙනේ (කරුණානන්ද 2007:112-113). ඒ බව පැහැදිලි වන්නේ වර්ෂ 1863 පයිලිගම ශ්‍රී සුමන රේවත නාහිමියන් අපවත් වීමෙන් පුරප්පාඩු වූ අටමස්ථානාධිපති තනතුරට භික්ෂූන් වහන්සේ නමක් පත්කරගැනීමේ කාර්යය නුවරවැව පවුලේ ප්‍රධානියාගේ සහභාගිත්වයෙන් තොරව සිදුවීමෙනි. නව අටමස්ථානාධිපති තෝරාගැනීම සඳහා පැවැත්වූ රැස්වීමේදී නුවරකලාවියේ රටේ මහත්වරුන් සහ කෝරාළවරුන් විසින් තෝරාගනු ලැබුවේ **කලුඑබේ ශ්‍රී සුමන ධම්මරක්ඛිත** හිමියන්වය. පෙර පැවති සම්ප්‍රදායට අනුව මෙම තෝරාගැනීම සිදු නොවූව ද, අවස්ථානුකූල එය අනුමත කරමින් අක්තපත්‍රය නිකුත් කිරීමට ඉංග්‍රීසි ආණ්ඩුකාරයා විසින් කටයුතු කරන ලදී (කරුණානන්ද 2007:98-99). මීට පසුව වසර 7 කින් අටමස්ථානාධිපති තනතුර පුරප්පාඩු වූ අවස්ථාවේදී ඒ සඳහා භික්ෂූන් වහන්සේ නමක් පත්කරගැනීමේ කාර්යයට නුවරවැව පවුලේ උරුමය වෙනුවෙන් පාර්ශව දෙකක් ඉදිරිපත්වීමත්, මෙම අවස්ථාවේදී එකී කිසිදු පාර්ශවයක් ඉදිරිපත් නොවීමත් ගැටලු සහගතය.

වර්ෂ 1870 දී කලුඑබේ ශ්‍රී සුමන ධම්මරක්ඛිත නාහිමියන්ගේ අපවත්වීමත් සමග පුරප්පාඩු වූ අටමස්ථානාධිපති තනතුරට භික්ෂූන් වහන්සේ නමක් පත්කරගැනීමේ කාර්යය මතභේදාත්මක වූයේ නුවරවැව පවුලේ ප්‍රධානියා ලෙස පාර්ශව දෙකක් ඉදිරිපත්වීමත් සමගය. මේ අන්දමින් පාර්ශව දෙකක් ඉදිරිපත්වීමට පෙර සූදානම්ව පැවතියේ වර්ෂ 1863 දී අනුගමනය කළ ක්‍රියාපිළිවෙත පූර්වාදර්ශය කරගනිමින් නව අටමස්ථානාධිපති පත්කරගැනීමට ය. ඒ යටතේ ඉදිරිපත් වූ භික්ෂූන් වහන්සේලා අතුරින් තෝරාගැනීමක් සිදුකරන ලද්දේ උගත් භික්ෂූන් වහන්සේලාගෙන් සමන්විත වූ අනු කමිටුවක් මගිනි. එහෙත් එයට විරෝධයක් මතුවූයේ නුසුදුසු යැයි තීරණය කෙරුණු භික්ෂූන් අතරට නුවරගම් පළාතේ රටේ මහත්මයා වූ රැලපනාවේ පුංචිරාළගේ ඥාතියෙකු වූ **අමුණුකොලේ උන්නාන්සේ** නම් භික්ෂූන් වහන්සේ ඇතුළත්වීමෙනි. අටමස්ථානාධිපති තනතුරට ස්වකීය ඥාති භික්ෂුව පත්කරගැනීමේ අපේක්ෂාවෙන් පසු වූ රැලපනාවේ රටේ මහත්මයා විසින් සිදුකරනු ලැබුවේ මහනුවර අස්ගිරි විහාරයේ ගිරානගම හිමියන්ගේ ප්‍රධානත්වයෙන් තවත් රැස්වීමක් පවත්වා අටමස්ථානාධිපති පදවියට අමුණුකොළේ හිමියන්ව තෝරාගැනීමයි (කරුණානන්ද 2007:99).

ඒ පිළිබඳ මතභේද ඇතිවූයෙන් නැවත වරක් රැස්වීමක් කැඳවනු ලැබීය. එය මල්වතු පාර්ශවයේ අනුනායක හිමිනමකගේ ප්‍රධානත්වයෙන් පැවැත්වීමට රැලපනාව රටේ මහත්මයා උත්සහ කිරීම සම්ප්‍රදායට පටහැනි බව දක්වූ අනෙක්

රටේ මහත්වරු දෙදෙනා ඊට විරුද්ධවීමත් සමග එකී රැස්වීමද අසාර්ථක විය (කරුණානන්ද 2007:99). මීළඟට පැවැත්වුණු තෙවැනි රැස්වීම සඳහා පුංචිමැණිකාගේ පුත් **ගලගොඩ බංඩා** සහභාගිවූයේ නුවරවැව පවුලේ නීත්‍යානුකූල නියෝජිතයා වශයෙන් ඉදිරිපත් වෙමිනි. ඔහු විසින් **දඹේවටවන හිමියන්** අටමස්ථානාධිපති තනතුර සඳහා යෝජනා කළ අතර එය අනුමත වූයේ රැස්ව සිටි පිරිසගේ කැමැත්ත හිමිවීමෙනි. ඊට එරෙහිව රටේ මහත්වරුන් තිදෙනා විසින් රැස්වීමක් කැඳවා ප්‍රතික්ෂේප කරනු ලැබූ අමුණුකොළේ හිමියන්ව අටමස්ථානාධිපති තනතුර සඳහා තෝරාගන්නා ලදී. මේ පිළිබඳ කරුණානන්ද දක්වන්නේ වර්ෂ 1863 දී අටමස්ථානාධිපති තේරීම පිළිබඳ තමන් ලැබූ වරප්‍රසාදය අහිමිවීමට පසුබිම සැකසෙමින් පැවතීම හේතුවෙන් මතභේද අත්හැර වරප්‍රසාද රැකගැනීම වෙනුවෙන් රටේ මහත්වරුන් සමගිවන්නට ඇති බවයි (2007:100). ඒ සමගම නුවරවැව පවුල නියෝජනය කිරීමේ නීත්‍යානුකූල අයිතිය ඇත්තේ නුවරවැව වලව්වේ ගලගොඩ බංඩාට නොව බුලංකුලම වලව්වේ ඕවිල්ලේ කුමාරිහාමිට බව හුරුළු සහ කලාගම් පළාත්වල රටේ මහත්වරුන් ප්‍රකාශ කිරීම නැවත ගැටළුවකට මුල පිරීමක් විය. මේ තත්ත්වය මත ඉංග්‍රීසි ආණ්ඩුවට සිදුවූයේ නුවරවැව පවුලේ නීත්‍යානුකූල නියෝජිතයා පිළිබඳ ගැටළුව නිරාකරණය කිරීමටය (කරුණානන්ද 2007:100).

මේ අවස්ථාවේදී අටමස්ථානාධිපති තෝරාගැනීම සඳහා නුවරවැව පවුලට හිමිව තිබූ අයිතිවාසිකමට එරෙහිව කරුණු ගණනාවක් ඉදිරිපත් කරන ලද්දේ රැලපනාවේ රටේ මහත්මයා විසිනි. ඔහුගේ තර්කය වූයේ උඩරට රාජධානි සමයේදී නුවරකලාවියේ ප්‍රධාන පරිපාලන තනතුර වූ මහවන්නියා පදවිය ඉසිලීම හේතුවෙන් නුවරවැව පවුලට අටමස්ථානාධිපති තෝරාගැනීමේ අයිතිය හිමිව තිබූ බවත්, වර්තමානයේදී එම පවුල කිසිදු නිලයක් නොදරන හෙයින් බලතල කිසිවක් එම පවුලට නොමැති බවයි. නුවරවැව පවුලේ අවසන් පුරුක වූ නුවරවැව බංඩා අපුත්‍රකව මිය ගිය හෙයින් ඕවිල්ලේ කුමාරිහාමිට හෝ ගලගොඩ බංඩාට ඒ සඳහා කිසිදු අයිතිවාසිකමක් ඉදිරිපත් කළ නොහැකි බව ඔහුගේ අදහස විය. මේ හැරුණු විට ඔහුගේ යෝජනාවක් වූයේ අටමස්ථානය පිහිටි ප්‍රදේශයේ ප්‍රධාන මුලාදෑනියා වූ මහවන්නියා තනතුර ඉසිලීමෙන් අටමස්ථානාධිපති තේරීමේ අයිතිය නුවරවැව පවුල හිමිකරගත් හෙයින් වර්තමානයේදී අටමස්ථානය පිහිටි නුවරගම් පළාතේ රටේ මහත්මයා වන තමාට එකී බලය හිමිවිය යුතු බවයි (කරුණානන්ද 2007:100-101).

මේ පිළිබඳ අදහස් දක්වන කරුණානන්ද දක්වන්නේ රැලපනාවේ රටේ මහත්මයා විසින් අටමස්ථානය පිළිබඳ භාරකාරීත්වයක් සහ අටමස්ථානාධිපති තෝරාගැනීම පිළිබඳ විශේෂ අයිතියක් නුවරවැව පවුලට හිමිව තිබීම පිළිබඳ කරන

ලද පැහැදිලි කිරීම දෝෂ සහගත බවයි. අටමස්ථානයේ ගිහි භාරකාරීත්වය නුවරවැව පවුලට හිමිවූයේ අටමස්ථාන පිහිටි ප්‍රදේශයේ ප්‍රධාන මුලාදෑනියා වූ මහවන්නියා තනතුර දැරීම හේතුවෙන් නොව ශ්‍රී මහා බෝධියේ රැකවරණය භාරව සිටි බෝධිගුප්ත කුමරුගෙන් පැවතීම හේතුවෙනි (කරුණානන්ද 2007:101).

නුවරවැව පවුලේ නීත්‍යානුකූල නියෝජිතයා පිළිබඳ ඉංග්‍රීසි ආණ්ඩුවේ නිලධාරීන් දරන ලද්දේද විවිධාකාර අදහස් කීපයකි. නුවරකලාවිය ප්‍රදේශය අයත්ව තිබූ උතුරු පළාතේ ඒජන්තවරයාගේ අදහස වූයේ වර්ෂ 1863 දී පරිදි මෙවර ද නුවරකලාවියේ මුලාදෑනීන් විසින් අටමස්ථානාධිපති හිමියන්ව තෝරාගත යුතු බවයි. එහෙත් රැජිනගේ නීතීඥවරයාගේ අදහස වූයේ මුලාදෑනීන් විසින් එය සිදුකරනු ලැබීම වර්ෂ 1853 දී ඇතිකරගෙන තිබූ සම්මුතියට පටහැනි බවයි. ඔහුගේ මෙන්ම අනුරාධපුරයේ සහකාර ඒජන්තවරයාගේද අදහස වී තිබුණේ අපුත්‍රකව මියගිය නුවරවැව බංඩාගේ වැන්දඹු බිරිඳ වූ ඕවිල්ලේ කුමාරිහාමිට වඩා නුවරවැව බංඩාගේ අර්ධ සොයුරියගේ පුත් නුවරවැව වලව්වේ පදිංචි ගලගොඩ බංඩාට නුවරවැව පවුල නියෝජනය කිරීමේ අයිතිය ඇති බවයි (කරුණානන්ද 2007:102). රැජිනගේ නීතීඥවරයාගේ අදහස පිළිගත් ඉංග්‍රීසි ආණ්ඩුකාර **හර්කියුලිස් රොබින්සන්**ගේ නියෝගය වූයේ ගලගොඩ බංඩාගේ ප්‍රධානත්වයෙන් රැස්වීමක් පවත්වා අටමස්ථානාධිපති තනතුරට සුදුසු භික්ෂුව තෝරාගන්නා ලෙසයි. ඒ අනුව වර්ෂ 1871 අප්‍රේල් 20 වනදා පැවති රැස්වීමේදී දඹේවටවන හිමියන් අටමස්ථානාධිපති තනතුර සඳහා තෝරාගන්නා ලද්දේ ගලගොඩ බංඩා විසින් කරන ලද යෝජනාවකට අනුවය. මෙකී රැස්වීම වර්ජනය කළ නුවරකලාවියේ මුලාදෑනීන් අනුරාධපුර සහකාර ඒජන්තවරයාට ලිඛිතව දන්වා සිටියේ රටේ මහත්වරුන් තිදෙනා සහ කෝරාළවරුන් 17 දෙනා මේ සඳහා සහභාගි නොවූ හෙයින් තෝරාගැනීම සම්ප්‍රදායට පටහැනි අවලංගු එකක් බවයි. රැජින නීතීඥයා ආණ්ඩුවට දන්වා සිටියේ ගලගොඩ බංඩා නුවරවැව පවුලේ නීත්‍යානුකූල නියෝජිතයා වන බැවින් රටේ මහත්වරුන්ගේ ඉල්ලීම ප්‍රතික්ෂේප කොට දඹේවටවන හිමියන්ට අක්තපත්‍රය ප්‍රදානය කළ යුතු බවයි (කරුණානන්ද 2007:102-103).

රටේ මහත්වරුන් සහ කෝරාළවරුන්ගේ පක්ෂපාතීත්වය රඳවාගැනීමේ අපේක්ෂාවෙන් ඉංග්‍රීසි ආණ්ඩුව නැවත වරක් පරීක්ෂණයක් පැවැත්වීමට අනුරාධපුර සහකාර ඒජන්තවරයාට නියම කළේ සාමකාමීව ගැටලුව විසඳා ගැනීමේ අපේක්ෂාවෙනි. අපුත්‍රකව මියගිය නුවරවැව බංඩා සතු දේපළ මෙන්ම අයිතිවාසිකම් සියල්ල ද තමාට හිමිව තිබෙන බවට ඕවිල්ලේ කුමාරිහාමි කරුණු ඉදිරිපත් කළාය. තම අයිතිය ඔප්පු කරන සාධක වශයෙන් ඇය ඉදිරිපත් කළේ අනුරාධපුර දිස්ත්‍රික් උසාවියෙන් දෙනු ලැබූ නඩු තීන්දු කීපයකි. ඊට ප්‍රතිවිරුද්ධව

ගලගොඩ බංඩා ඉදිරිපත් කළ තර්කය වූයේ අපුත්‍රකව නුවරවැව බංඩා මියගිය හෙයින් ඔහුගේ අර්ධ සොයුරියටත්, ඇගේ පුත්‍රයා වන තමාටත් නුවරවැව පවුලේ උරුමය හිමිවිය යුතු බවයි. සියලු කරුණු සැලකිල්ලට ගත් ඉංග්‍රීසි ආණ්ඩුව, රජින නීතිඥ රිචඩ් මෝර්ගන් වෙත ප්‍රශ්නය යොමුකළ අතර ඉහතින් දක්වන ලද නඩු වාර්තා පාදක කරගනිමින් ඕවිල්ලේ කුමාරිහාමි නුවරවැව පවුලේ නිත්‍යානුකූල නියෝජිතයා බව **මෝර්ගන්**ගේ තීරණය විය. ඊට එරෙහිව විරෝධතා ඇත්නම් නිශ්චිත කාලයක් තුළ එය ඉදිරිපත් කිරීමට ගලගොඩ බංඩාට අවස්ථාව ලබා දී තිබුණද, එය සිදුකිරීමට ඔහු අපොහොසත් වීමෙන් ඕවිල්ලේ කුමාරිහාමිගේ අයිතිය තහවුරු කෙරිණි (කරුණානන්ද 2007:104). මෙම සිදුවීම එක් අතකින් ඓතිහාසික සිදුවීමක් බවට පත්වන්නේ කාන්තාවක් විසින් මෙරටට වැඩම කරවනු ලැබූ ශ්‍රී මහා බෝධියේ භාරකාරීත්වය වසර දෙදහසකට පමණ පසු නැවත වරක් කාන්තාවකට හිමි වූ හෙයිනි.

නුවරවැව බංඩාගේ අභාවයෙන් ඔහු සතු ඉඩකඩම් හා වරප්‍රසාද ඔහුගේ මවට පැවරුණු ආකාරය සහ පසුව ඇයගෙන් නුවරවැව බංඩාගේ වැන්දඹු බිරිඳට ඒවා පැවරුණු ආකාරය පිළිබඳ කන්ද උඩරට රාජධානි සමය තුළ පැවති නීති ව්‍යවහාරය පාදක කොටගෙන සම්පාදිත *නීති නිඝණ්ඩුවට* අනුව පහත පරිදි විග්‍රහ කළ හැකියි. නුවරවැව බංඩාගේ මරණයෙන් පසුව ඔහුගේ වැන්දඹු බිරිඳ සහ ඔහුගේ අර්ධ සොයුරිය වූ පුංචිමැණිකා සිටියදී ඔහුගේ මවට ඉඩකඩම් හා වරප්‍රසාද පැවරුණු ආකාරය ගැටලු සහගතය. *නීති නිඝණ්ඩුවට* අනුව ඉඩම් හිමියාගේ මරණයෙන් පසුව පවුලේ අන් අයෙකු නොමැති වූ විට පමණක් ඉහත කී ආකාරයට ඔහුගේ නම සහ පාරම්පරික ඉඩකඩම් පවත්වාගෙන යාමට භාර්යාවට ඉඩම් හිමිවේ (නීති නිඝණ්ඩුව 2009:89). නුවරවැව බංඩාගේ සහෝදරිය වශයෙන් පුංචිමැණිකා පිළිගැනෙන හෙයින් ඇයගේ හිමිකම අහිමි කොට ඇති බව පෙනේ. මේ හැරෙන්නට *නීති නිඝණ්ඩුවට* අනුව ඉඩම් හිමියෙකුට එක් බිරිඳකගෙන් පුතෙක්ද, තවත් බිරිඳකගෙන් දියණියක්ද සිටියදී දියණියට දීග විවාහයක් කර දී ඇත්නම්, පියාගේ මරණින් පසු පුතා පියාගේ සියලුම ඉඩකඩම්වලට නීත්‍යානුකූල උරුමකරු වේ (2009:113). එහෙත් පුංචිමැණිකා බින්න විවාහයකට එළඹී ඇති හෙයින් ඇගේ උරුමය අහිමි නොවේ. ලේ උරුමය අනුව බැලූවිටද පුංචිමැණිකා සහ ඇගේ පුත්‍රයා වූ ගලගොඩ බංඩාට නුවරවැව පවුලේ ප්‍රධානත්වය සඳහා වැඩි අයිතිවාසිකමක් ඇති බව පැහැදිලි ය. අවධානය යොමු කළ යුතු තවත් වැදගත් කරුණක් වන්නේ නුවරවැව පවුලේ උරුමය පිළිබඳ ඇති වූ මෙම අර්බුදකාරී අවස්ථාවේ උරුමය වෙනුවෙන් ඉහතින් සඳහන් කළ මහවන්නියාගේ අර්ධ සොහොයුරු **නුවරවැවේ කුඩා මුදියන්සේ**ගේ දරුවන් ඉදිරිපත් නොවූයේ මන්ද යන්නයි. නුවරවැව පවුලේ ප්‍රධානත්වය බුලංකුලම වලව්වේ ඕවිල්ලේ කුමාරිහාමිට හිමිවන බව අධිකරණය තීන්දු කිරීම හේතුවෙන් නුවරවැව වලව්වේ විසූ

පුංචිමැණිකා ඇතුළු පිරිස අනුරාධපුරය අතහැර මහනුවරට පදිංචියට ගොස් තිබේ. එකී පවුලට අයත් කිසිවෙකු අනුරාධපුරයේ දක්නට නොමැති බව කරුණානන්ද දක්වයි (2007:104).

**බුලංකුලම පවුල යටතේ අටමස්ථාන භාරකාරීත්වය**

නුවරවැව පවුලේ උරුමය පිළිබඳ අර්බුදය නිමාවට පත්වීමත් සමග අටමස්ථානාධිපති තෝරා ගැනීම සඳහා වූ රැස්වීම පවත්වන ලද්දේ නුවරවැව පවුලේ නීත්‍යානුකූල නියෝජිතයා වූ බුලංකුලම වලව්වේ ඕවිල්ලේ කුමාරිහාමිගේ ප්‍රධානත්වයෙන් සහ නුවරකලාවියේ රටේ මහත්වරුන් තිදෙනා, කෝරාළවරුන්ගේ මූලිකත්වයෙනි. එහිදී ඕවිල්ලේ කුමාරිහාමි විසින් අටමස්ථානාධිපති තනතුරට යෝජනා කරන ලද **උඩුරුව හල්මිල්ලවැවේ රතනපාල** හිමියන්ට සියලු දෙනාගේම අනුමැතිය හිමිවූයෙන් ආණ්ඩුව විසින් අක්ත පත්‍රය ප්‍රදානය කරන ලදී (කරුණානන්ද 2007:104).

මෙලෙස කාන්තාවකගේ ප්‍රධානත්වයෙන් පැවැත්වුණු රැස්වීමකින් අටමස්ථානාධිපති තනතුරට මෙන්ම මල්වතු පාර්ශවයේ අනුනායක තනතුරකට භික්ෂූන් වහන්සේ නමක් පත්කරගැනීම විශේෂ සිදුවීමකි. ලංකාවේ ස්ථාපිත සෑම නිකායකම පාහේ නායක තනතුරු සඳහා භික්ෂූන් වහන්සේලා පත්කරගනු ලබන්නේ ඒ ඒ ප්‍රදේශවල වැඩ වසන භික්ෂූන් වහන්සේලාගේ ඡන්දයෙන් හෝ නායක භික්ෂූන් වහන්සේලාගේ ඡන්දයෙනි. ඒ කිසිදු අවස්ථාවක ගිහි මැදිහත්වීමක් දැකගත නොහැකි නමුත් මෙහිදී ගිහි මැදිහත්වීම පමණක් නොව කාන්තාවක් ප්‍රධානත්වය ගැනීම ද දැකගත හැකිය. මේ පිළිබඳ අදහස් දක්වන කරුණානන්ද ප්‍රකාශ කරන්නේ බ්‍රිතාන්‍ය නීතියට අනුව කාන්තාවකගේ මූලිකත්වයෙන් නායක භික්ෂූන් වහන්සේ නමක් පත්කිරීම වරදක් සේ නොපෙනුණද, බෞද්ධ සම්ප්‍රදායට එය නොගැලපෙන බවක් පෙන්නුම් කරන බවයි (කරුණානන්ද 2015:93-94).

ඕවිල්ලේ කුමාරිහාමි අටමස්ථානයේ ගිහි භාරකාරීත්වය දැරූ කාලවකවානුවේ සිදු වූ වැදගත් සිදුවීමක් වශයෙන් දැක්විය හැක්කේ **නාරංවිට සුමනසාර** හිමියන්ගේ මූලිකත්වයෙන් රුවන්මැලිසෑයේ ප්‍රතිසංස්කරණ කටයුතු වර්ෂ 1872 දී පමණ ආරම්භවීමයි. එවකට අනුරාධපුර නගරයේ අබෞද්ධ බලය දැඩි ලෙස පැතිර තිබුණු හෙයින් උන්වහන්සේගේ කාර්යය අතිශය දුෂ්කර එකක් වූ නමුත් ඕවිල්ලේ කුමාරිහාමිගේ සහයෝගය හිමිවීම පහසුවක් වන්නට ඇත. ඒ යටතේ මුල්කාලයේදී ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා අවශ්‍ය කම්කරුවන් සහ ආධාර ලබාදීම සිදුකරන ලද්දේ ඕවිල්ලේ කුමාරිහාමි විසිනි (කරුණානන්ද 2007:49-50).

වර්ෂ 1862 දී පමණ තරුණ වැන්දඹුවක් වූ ඕවිල්ලේ කුමාරිහාමි නැවත විවාහ ජීවිතයකට එළඹි අතර (කරුණානන්ද 2015:93) ඇගේ දෙවන ස්වාමිපුරුෂයා වූයේ අනුරාධපුර කච්චේරියේ **සරප් මුහන්දිරම්වරයා**ය. ඔහු කලාගම් පළාතේ රටේ මහත්මයාගේ වූ **ඒකනායක බණ්ඩාර**ගේ පුත්‍රයා බව ඉංග්‍රීසි ජාතික ආර්නෝල්ඩ් රයිට් සිය Twentieth Century Impressions of Ceylon නම් කෘතියේ දක්වයි (Wright 2004:779). ඕවිල්ලේ කුමාරිහාමි දෙවැනි වර විවාහ වීමත් සමග පළමු විවාහයෙන් හිමි වූ අයිතිවාසිකම් ඇයට අහිමි නොවීම ද විශේෂයෙන් සැලකිය යුත්තකි. නීති නිඝණ්ඩුවට අනුව ස්වාමිපුරුෂයාගේ මරණින් පසු බිරිඳ තවත් විවාහයක් කරගතහොත් පළමු සැමියාගේ දේපවලින් ලැබෙන නඩත්තු නතර වේ. එහෙත් මියගිය ස්වාමිපුරුෂයාගේ ඥාතීන්ගේ අභිමතය ඇතිව ඔහුගේ ගෙඉඩමේ බින්න විවාහයක් ආරම්භ කිරීමෙන් තම ස්වාමියාගේ මරණයෙන් පසු තවත් විවාහයක් කරගත්තද, පෙර විවාහයේ අයිතිවාසිකම් පවතී (නීති නිඝණ්ඩුව 2009:91-92). ඕවිල්ලේ කුමාරිහාමිගේ දෙවන විවාහයට නුවරවැව බංඩාගේ ඥාතීන්ගේ අභිමතය හිමිවීම පිළිබඳ කරුණු හමුනොවුණද, ඇය පළමු ස්වාමිපුරුෂයාගෙන් හිමි වූ බුලංකුලම වලව්වේ බින්න විවාහයකට එළඹීම හා නුවරවැව පවුලේ උරුමය පවත්වාගෙන යායුතු වීම යන කරුණු මත ඇගේ පළමු විවාහයේ අයිතිවාසිකම් අහිමි නොවන්නට ඇත.

ඕවිල්ලේ කුමාරිහාමිගේ දෙවැනි විවාහයෙන් වර්ෂ 1863 දී උපන් පුත්‍රයාට සූරියකුමාර වන්නිසිංහ මුදියන්සේ රාළහාමිලාගේ බුලන්කුලමේ ලොකු බණ්ඩා නමින් නම් තැබුණු අතර ඔහුට සිය පළමු ස්වාමිපුරුෂයාගේ පෙළපත් නාමය යෙදීමටද ඕවිල්ලේ කුමාරිහාමි කටයුතු කළ බව පෙනේ. ඇගෙන් පසුව පුත්‍රයාට නුවරවැව පවුලේ උරුමය පවත්වා ගෙනයාම පහසුවීම සඳහා ඇය විසින් එවැන්නක් සිදුකරන්නට ඇතැයි අනුමාන කළ හැකිය. ත්‍රිත්ව විද්‍යාලයේ අධ්‍යාපන ලැබූ **ලොකු බණ්ඩා** විවාහ වූයේ මාතලේ කහඳ වලව්වේ **වේරගම ටිකිරි කුමාරිහාමි** සමගය (Wright 2004:779).



ඡායාරූපය 4 : ලොකු බණ්ඩා බුලංකුලම රටේ මහත්මයා (Wright 2004:779)

වර්ෂ 1880 දී නුවරවැව පවුලේ ප්‍රධානියා වශයෙන් අටමස්ථානයේ ගිහි භාරකාරීත්වයට පත් වූ ඔහු (කරුණානන්ද 2007:167) නුවරගම් පළාතේ රටේ මහත්මයා වශයෙන් හා ගම්සභාවේ සභාපති වශයෙන්ද

කටයුතු කර තිබේ (Wright 2004:779). සාමවිනිසුරු ලොකු බංඩාර බුලංකුලමේ දිසාව නමින්ද ඔහුව හැඳින්වූ බවට සාධක හමුවේ (ඡායාරූපය 09).







ඡායාරූපය 5 : ලොකු බණ්ඩා බුලංකුලම රටේ මහත්මයාගේ සොහොන් ඵලකය (වමේ)
ඡායාරූපය 6 : ලොකු බණ්ඩා බුලංකුලම රටේ මහත්මයාගේ සොහොන (දකුණේ)
https://www.facebook.com/TheBulankulameFamily/

ඔහුගේ බිරිඳ විසින් පුද්ගලික ධන පරිත්‍යාගයෙන් ශ්‍රී මහා බෝධියේ මැද පන්සල් භූමියේ ධර්ම ශාලාවක්ද ඉදිකරවන ලදී (කරුණානන්ද, 2007:31). මේ හැරෙන්නටවර්තමානයේදී දැකිය හැකි නුවරවැව වලව්ව ඉදිකිරීමේ කටයුතු වර්ෂ 1906 දී නිමාවට පත්කරන ලද්දේ ලොකු බණ්ඩා බුලංකුලම විසිනි (ඡායාරූපය 11). මෙය පැරණි නුවරවැව වලව්ව ප්‍රතිසංස්කරණයක්ද නොඑසේනම් නව ඉදිකිරීමක්ද යන වග නිශ්චිතව කිව නොහැක. එතැන් පටන් වත්මන් නුවරවැව ප්‍රධානියා දක්වා සියලු දෙනාගේ වාසස්ථානය වී ඇත්තේ එකී නුවරවැව වලව්වයි.


ලොකු බණ්ඩා බුලංකුලමගේ ඇවෑමෙන් ඔහු පුත් **පුංචි බණ්ඩා බුලංකුලම** දිසාවේ වෙත අටමස්ථානයේ ගිහි භාරකාරීත්වය පැවරුණේ වර්ෂ 1936 දී පමණය. අනතුරුව පිළිවෙලින් අටමස්ථානයේ ගිහි භාරකාරීත්වය සඳහා ඔහුගේ බාල සොයුරන් වූ වෛද්‍ය **අශෝක බුලංකුලම** වර්ෂ 1944 දීද, **පුංචි බණ්ඩා බුලංකුලම** ගම්සභා විනිශ්චයකාරතුමා වර්ෂ 1950 දීද පත් කෙරිණි (කරුණානන්ද 2007:105). පසුව ඔවුන්ගේ බාලම සොයුරා වූ සමූපකාර පරීක්ෂක **කුඩා බණ්ඩා බුලංකුලම**ගේ වැඩිමහල් පුත්



ඡායාරූපය 7 : වර්ෂ 1906 ඉදිකරන ලද නුවරවැව වලව්ව
https://www.facebook.com/janaka.bulankulame

ප්‍රසිද්ධ නොතාරිස් **මහින්ද බුලංකුලම** වර්ෂ 1968 දී අටමස්ථාන භාරකාර ධූරයට පත් කෙරුණේ පුංචි බණ්ඩා බුලංකුලම යෝජනාවෙනි (ජයසිංහ 2011).


මහින්ද බුලංකුලමගේ කාලසීමාවේදී ශ්‍රී මහා බෝධියේ වර්තමාන නැගෙනහිර මකර තොරණ ඉදිකිරීමේ කටයුතු 1980 දශකයේ සිදුකෙරුණු අතර ඒ සඳහා මූල්‍යමය දායකත්වය සපයන ලද්දේ නුවරවැව පවුලේ සාමාජිකයන් විසිනි. ඔවුන්ගේ අපේක්ෂාව වූයේ අභාවප්‍රාප්ත හිටපු අටමස්ථානයේ ගිහි භාරකාර ලොකුබණ්ඩා බුලංකුලමේ රටේ මහත්මයා සහ ඔහුගේ බිරිඳ වූ ටිකිරි කුමාරිහාමි සිහිපත් කරමින් එය ගොඩනැංවීමයි (ඡායාරූපය 12).


ඡායාරූපය 12 : නැගෙනහිර මකර තොරණේ සමරු ඵලකය

වර්ෂ 2006 දී මහින්ද බුලංකුලමගේ පුත් වෛද්‍ය **ජානක අනුරාධ බුලංකුලම** අටමස්ථාන භාරකාරීත්වය සඳහා පත්කෙරුණු අතර වර්තමානය දක්වා එකී තනතුර හොබවනු ලබන්නේ ඔහු විසිනි (කරුණානන්ද 2007:105).

### අටමස්ථානාධිපති තනතුරින් ඉවත් කිරීමේ බලය

ඉහතින් දක්වන ලද අන්දමට අටමස්ථානාධිපති තනතුර සඳහා භික්ෂූන් වහන්සේ නමක් නම්කිරීමේ බලය මෙන්ම තනතුරින් පහකිරීමේ බලයද නුවරවැව පවුලේ ප්‍රධානියා හිමිව තිබේ. නුවරවැව පවුලේ ප්‍රධානියාගේ ප්‍රධානත්වයෙන් නුවරකලාවියේ මුලාදෑනීන්ගේ සහභාගිත්වයෙන් රැස්වුණු කමිටුවකින් අටමස්ථානාධිපති තනතුර සඳහා භික්ෂූන් වහන්සේ නමක් තෝරාගත පරිදිම අටමස්ථානාධිපති වශයෙන් වැරදි සිදුකරන්නේ නම් එපරිද්දෙන්ම රැස්වී අටමස්ථානාධිපති තනතුරින් පහකිරීමට අවස්ථා කීපයකදීම කටයුතු සිදු වූ බව පෙනේ. එහිදී බොහෝ විට සිදුවන්නට ඇත්තේ මහවන්නියාගේ අදහසට හුදු චාරිත්‍රයක් වශයෙන් අනෙක් මුලාදෑනීන්ගේ ද අනුමැතිය හිමිවීම බව කරුණානන්ද අදහස් කරයි (2007:105).

ඡායාරූපය 8 : පුංචි බණ්ඩා බුලංකුලම දිසාවේ (ඉහළ වම)
https://www.facebook.com/TheBulankulameFamily/
ඡායාරූපය 9 : වෛද්‍ය අශෝක බුලංකුලම (ඉහළ මැද)
https://www.facebook.com/TheBulankulameFamily/
ඡායාරූපය 10 : පුංචි බණ්ඩා බුලංකුලම ගම්සභා විනිශ්චයකාරතුමා (ඉහළ දකුණ)
https://www.facebook.com/TheBulankulameFamily/
ඡායාරූපය 11 : මහින්ද බුලංකුලම (පහළ වම) (ජයසිංහ 2011)
ඡායාරූපය 13 : වෛද්‍ය ජානක අනුරාධ බුලංකුලම (පහළ දකුණ)
https://www.facebook.com/janaka.bulankulame

නුවරවැව බංඩා ප්‍රකාශ කර ඇති අන්දමට ඔහුගේ මුත්තණුවන්ගේ කාලයේදී සහ පියා වූ මහවන්නියාගේ කාලයේදී අටමස්ථානාධිපති ධූරය දැරූ **උල්ලුකුලමේ හිමි**, **අන්දරවැවේ හිමි**, **දිවුල්වැව හිමි**, **කරුක්කන්කුලමේ හිමි** සහ **පාලුවැව හිමි** තනතුරින් පහකිරීමට සිදුව තිබේ. මේ අවස්ථාවලදී අටමස්ථානාධිපති වශයෙන් උන්වහන්සේලා විසින් සිදුකරන ලද වරදට දඬුවම් වශයෙන් සිවුරු හැරවීම සිදුකළ යුතු බවට නුවරවැව පවුලේ ප්‍රධානියා ඇතුළු නුවරකලාවියේ මුලාදැනීන් තීරණය කිරීමෙන් පසුව සියම් නිකායේ මල්වතු පාර්ශවයේ මහනායක හිමියන් විසින් එය සිදුකර ඇත (කරුණානන්ද 2007:105-106). මෙහි විශේෂත්වය වන්නේ අටමස්ථානාධිපති තනතුර දරන භික්ෂුව මල්වතු පාර්ශවයට අයත් වුවත්, අටමස්ථානාධිපති වශයෙන් සිදුකරන ලද කිසිදු වැරැද්දකට දඬුවම් කිරීමේ බලයත් මල්වතු මහනාහිමිට නොවීමයි. අටමස්ථානාධිපති තනතුරට භික්ෂූන් වහන්සේ

නමක් පත්කිරීමේ බලය උන්වහන්සේට නොමැති හෙයින් ඉවත්කිරීමේ බලයක්ද උන්වහන්සේට නැත. කිසියම් අවස්ථාවකදී භික්ෂුවකට අකැප අයුරින් ක්‍රියාකරන්නේ නම් එකී භික්ෂුව සිවුරු හැරවීමේ බලය මල්වතු මහනාහිමියන්ට ඇත. ඒ අනුව භික්ෂුවක් නොවන්නෙකුට අටමස්ථානාධිපති තනතුර දැරිය නොහැකි හෙයින් තනතුර පුරප්පාඩු වීම සිදුවේ (කරුණානන්ද 2007:106). මේ තත්ත්වය ඉතා විශේෂ එකක් බව පෙනීයන්නේ අටමස්ථානාධිපති පත්කිරීම පිළිබඳ නුවරවැව ප්‍රධානියාගේ බලය හෝ මල්වතු පාර්ශවයේ භික්ෂුවක් පිළිබඳ මල්වතු මහනාහිමිගේ බලය නොඉක්මවීමට මෙහිදී කටයුතු සිදුනොවීමයි.

ඉංග්‍රීසි පාලනය යටතේ අවස්ථා දෙකකදී අටමස්ථානාධිපති ඉවත්කිරීම සඳහා කටයුතු සිදුකෙරුණු නමුත් එය සාර්ථකව ඇත්තේ පළමු අවස්ථාවේදී පමණි. වර්ෂ 1816 දී අටමස්ථානාධිපති ධුරයට පත් **ඉපලෝගම ශ්‍රී සුමන බුද්ධරක්ඛිත** නාහිමියන් භික්ෂුවකට නොකටයුතු අන්දමින් කටයුතු කර ඇති බවට චෝදනා එල්ලවූ අතර මල්වතු මහනාහිමිගේ උපදෙස් මත පැවැත්වුණු පරීක්ෂණයෙන්ද ඒ බව තහවුරු කෙරිණි. ඒ අනුව වර්ෂ 1843 දී ඉපලෝගම හිමියන්ගේ සිවුරු හැරවීමත් සමග අටමස්ථානාධිපති තනතුර අහෝසි වූ අතර ඉංග්‍රීසි ආණ්ඩුවට ඒ බව දැන්වීමෙන් ආණ්ඩුකරු ප්‍රදානය කළ අක්තපත්‍රය අවලංගු කිරීමට කටයුතු කර තිබේ (කරුණානන්ද 2007:106).

දෙවන අවස්ථාවේදී එනම් වර්ෂ 1843 දී අටමස්ථානාධිපති ධුරයට පත්කෙරුණු පයිලිගම ශ්‍රී සුමන රේවත නාහිමියන් භික්ෂුවකට අකැප ලෙස කටයුතු කරන බවට චෝදනා එල්ල වූ අතර මල්වතු මහනාහිමියන්ගේ උපදෙස් මත පැවැත්වුණු පරීක්ෂණයෙන්ද එය තහවුරු කෙරිණි. ඒ අනුව උන්වහන්සේ සිවුරු හැරවීමට කටයුතු කළද, උන්වහන්සේගේ අක්තපත්‍රය අවලංගු කිරීමට ඉංග්‍රීසි ආණ්ඩුව කටයුතු නොකිරීමෙන් ඇතිවූයේ අර්බුදකාරී තත්ත්වයකි (කරුණානන්ද 2007:106-107). එවන් පසුබිමක් තුළ මල්වතු මහනාහිමියන්ට එරෙහිව නඩු මගට පිවිසි පයිලිගම හිමියෝ තමන්වහන්සේ තනතුරින් පහකිරීමට මල්වතු මහනාහිමියන් කටයුතු කිරීම සම්ප්‍රදායට එකඟ නොවන බව පවසමින් කරුණු වරදවා විග්‍රහ කළහ. එය පිළිගත් උසාවිය තීන්දු කරන ලද්දේ පයිලිගම හිමියන් තනතුරින් ඉවත්කිරීම නීත්‍යානුකූල නොවන බවයි. මේ පිළිබඳ කරුණු නිවැරදි කිරීමට නුවරවැව බංඩා හෝ මල්වතු මහනාහිමියන් හෝ කටයුතු කළ බවක් නොපෙනේ (කරුණානන්ද 2007:109-110). ඉහත සිදුවීම්වලින් අනතුරුව මෙතෙක් අටමස්ථානාධිපති ධුරය දැරූ භික්ෂූන් වහන්සේ නමක් ඉවත් කිරීමට කටයුතු කිරීමක් සිදු වී නොමැත.

### අටමස්ථාන කමිටුව

කීර්ති ශ්‍රී රාජසිංහ රජ දවස (1747-1782) වැලිවිට සරණංකර සඟරජ හිමියන්ගේ උපදෙස් මත, මහවන්නියා ධූරය දරූ නුවරවැව පවුලේ ප්‍රධානියාගේ මූලිකත්වයෙන් යුතුව වන්නියාවරු 16 දෙනෙකු සමන්විතව 'අටමස්ථාන කමිටුවේ' සංයුතිය මුල්වරට සැකසූ බව කියැවේ (කරුණානන්ද 2007:93-95). අනතුරුව ඉංග්‍රීසි පාලන සමයේදී වරින් වර සංශෝධනවලට ලක් වූ අටස්ථාන කමිටුව සංයුතිය අවසන් වරට වර්ෂ 1931 දී නැවත සකස් කෙරුණු අතර ඒ යටතේ අටමස්ථාන කමිටුවේ සාමාජිකයන් ගණන තුන දක්වා අඩු කර තිබේ.

අටමස්ථානාධිපති, නුවරවැව පවුලේ ප්‍රධානියා සහ මල්වතු අස්ගිරි මහනාහිමිවරුන් හා ශ්‍රී පාදස්ථාන නාහිමියන් විසින් නම් කරන ලද සාමාජිකයාගෙන් සමන්විත කමිටුවේ සභාපතිත්වය නුවරවැව පවුලේ ප්‍රධානියාට හිමිවේ (කරුණානන්ද 2007:122-123). බොහෝවිට මල්වතු අස්ගිරි මහනාහිමිවරුන් හා ශ්‍රී පාදස්ථාන නාහිමියන් විසින් නම් කරන ලද සාමාජිකයා වන්නේ රුවන්මැලිසෑයේ විහාරාධිකාරී ධූරය දරන නාහිමියන්ය (සිරිනිවාස හිමි 2007:21). අටමස්ථානාධිපති ධූරය පුරප්පාඩු වූ විට ඒ සඳහා බොහෝවිට නම් කරනු ලබන්නේ රුවන්මැලිසෑයේ විහාරාධිකාරී හිමියන්ට වීම ඒ සඳහා හේතුවන්නට ඇත. මීට අතිරේකව කමිටුවේ ලිපි ලේඛන තබාගැනීම, අය වැය වාර්තා සැකසීම ආදී කටයුතු සඳහා ලේකම්වරයෙකුගේ සේවයද ලබාගැනේ (කරුණානන්ද 2007:122-123).

ලංකාව නිදහස ලැබීමත් සමග අටමස්ථානාධිපති ධූරය පුරප්පාඩු වූ විට ඒ සඳහා ගනු ලබන ක්‍රියාමාර්ගවල සුළු වෙනස්කම් කීපයක් සිදුව තිබේ. වර්තමානයේදී අටමස්ථානාධිපති ධූරය පුරප්පාඩු වූ විට නුවරවැව පවුලේ ප්‍රධානියාගේ මූලිකත්වයෙන් රැස්වන අටමස්ථාන කමිටුව මගින් සුදුසුකම් සපුරා තිබෙන භික්ෂූන් වහන්සේලා පිළිබඳව සහ අටමස්ථානාධිපති හිමියන් ජීවත්ව සිටියදී නම් කරනු ලැබූ භික්ෂූන් වහන්සේ පිළිබඳව අවධානය යොමු කරනු ලබයි. ඉන්පසුව අටමස්ථාන කමිටුවේ නිර්දේශය මල්වතු මහනාහිමියන්ට සහ බෞද්ධ කටයුතු කොමසාරිස්වරයාට ලිඛිතව දැනුම් දීමෙන් අනතුරුව එය අනුමත කොට ස්ථිර කරනු ලබන්නේ බෞද්ධ කටයුතු කොමසාරිස්වරයා විසිනි. අවසානයේදී ජනාධිපතිවරයා විසින් අටමස්ථානාධිපති ධූරයට අදාළ අක්ත පත්‍රය අත්සන් තබා අභිනව අටමස්ථානාධිපති හිමියන්ට පිළිගන්වනු ලබයි (සිරිනිවාස හිමි 2007:22).

### නුවරවැව පවුලේ සාම්ප්‍රදායික ඇඳුම


අටමස්ථාන ගිහි භාරකාරීත්වය උසුලන නුවරවැව පවුලේ ප්‍රධානියා සඳහා උත්සව අවස්ථාවලදී ඇඳීමට විශේෂ ඇඳුම් කට්ටලයක් පවතී. හිටපු නුවරවැව පවුලේ

ප්‍රධානියෙකු වූ මහින්ද බුලංකුලම දක්වන අන්දමට එය උඩරට මුල් ඇඳුමට බොහෝ සෙයින් සමාන වුවත් සියුම් අන්දමේ වෙනස්කම් පවතින්නකි. ඉන්දියාවේදී නිර්මාණය කර තිබෙන එකී ඇඳුම් කට්ටල අලුත්වැඩියා කිරීම සඳහා ද ඉන්දියාවට පිටත් කරනු ලබන බවත්, වර්තමානයේ භාවිත කරන ඇඳුම් කට්ටල වසර සියයක් පමණ පැරණි බවත් ඔහුගේ අදහසයි (ජයසිංහ 2011).

හිටපු නුවරවැව පවුලේ ප්‍රධානීන්ගේ ඡායාරූප දෙස විමසිල්ලෙන් බලන විට එහි බඳ පටියේ එයට ආවේණික විශේෂ අනන්‍යතාවක් තිබෙන බව පෙනේ. ඒ හැරුණු විට හිස්වැස්මේ සහ හැට්ටයේ මෝස්තර ආදිය යොදා ඇති ආකාරය උඩරට මුල් ඇඳුමේ රූකම් රටාවලින් වෙනස් ආකාරයක් ගෙන තිබේ (ඡායාරූප 04, 10, 11).

**නුවරවැව පවුලේ වංශ ලාංඡනය**

අනුරාධපුර යුගය දක්වා අතීතයකට උරුමකම් කියන නුවරවැව පවුල විසින් භාවිත කරනු ලැබූ වංශ ලාංඡනයක තොරතුරු ඔවුන්ගේ සොහොන් ස්මාරකයක තිබී හමුව තිබේ. ඕවිල්ලේ කුමාරිහාමි ඇවෑමෙන් අටමස්ථානයේ ගිහි භාරකාරීත්වයට පත් ඇගේ පුත් **සූරියකුමාර වන්නිසිංහ බුලංකුලමේ ලොකු බණ්ඩා** රටේ මහත්මයාගේ සොහොන් ගෙයි ද්වාරයට ඉහළින් එම ලාංඡනය දැකිය හැකිය (ඡායාරූපය 14).



ඡායාරූපය 14 : ලොකු බණ්ඩා බුලංකුලම රටේ මහත්මයාගේ
සොහොන්ගෙයි ඇති වංශ ලාංඡනය
https://www.facebook.com/TheBulankulameFamily/

දෙපසට විහිදුණු බෝ පත්‍ර දෙකක් මැදිකොට ඇති පද්මයක් දක්වා තිබෙන අතර ඊට පෙර නුවරවැව පවුලේ සාමාජිකයන් එවැනි ලාංඡනයක් භාවිත කළ බවට මෙතෙක් සාධක හමු වී නොමැත. ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ ගිහි භාරකාරීත්වය දරන නුවරවැව පවුලේ වංශ ලාංඡනය, ශ්‍රී මහා බෝධිය සමග ඔවුන්ගේ ඇති සම්බන්ධය පිළිබිඹු කෙරෙන ආකාරයට නිර්මාණය කර ඇති බව පෙනේ.

**නුවරවැව පවුලේ ප්‍රධානත්වය පැවරෙන අන්දම**

නුවරවැව පවුලේ ප්‍රධානත්වය පිය පුතු පරපුරෙන් පැවත එන අතර එය විටෙක සොයුරන් අතර ද හුවමාරු වන බව පෙනේ. බොහෝ විට සිදුවන්නේ ඊට පෙර එකී ධූරය දැරූ අය විසින් අනුප්‍රාප්තිකයා නම් කරනු ලැබීමයි. පසුව පවුලේ සියලු දෙනාගේ කැමැත්ත ඒ සඳහා ලබාගෙන බෞද්ධ කටයුතු කොමසාරිස් වෙත නුවරවැව පවුලේ නව ප්‍රධානියා පිළිබඳ දැන්වීම සිදුකෙරේ. අනතුරුව ලිඛිත ලියවිල්ලක් මගින් නුවරවැව පවුලේ ප්‍රධානියා ලෙස එකී පුද්ගලයාව බෞද්ධ කටයුතු කොමසාරිස් විසින් පිළිගැනීම සිදුකරනු ලබයි (කරුණානන්ද 2007:105, ජයසිංහ 2011).

**නුවරවැව පවුලේ ප්‍රධානියාගේ වත්මන් කාර්යභාරය**

අටමස්ථානාධිපති තනතුර පුරප්පාඩු වූ විට ඒ සඳහා භික්ෂූන් වහන්සේ නමක් පත්කිරීම සඳහා යෝජනා කිරීම මෙන්ම බෝ මළුවේ දේවාලය සඳහා කපුමහත්වරුන් පත්කිරීම, ශ්‍රී මහා බෝධිය වන්දනා කිරීමට පැමිණෙන ප්‍රභූවරුන් පිළිගෙන ඉහළ මළුවට කැඳවාගෙන යාම, ශ්‍රී මහා බෝධිය ආශ්‍රිත ප්‍රධාන මංගල්‍යයන් පැවැත්වීම ආදී වගකීම් රැසක් වර්තමානයේදීද නුවරවැව පවුලේ ප්‍රධානියාට පැවරී තිබේ (ජයසිංහ 2011, කුරුනේරු 2015).

ශ්‍රී මහා බෝධිය සම්බන්ධ මංගල්‍යයන් අතුරින් පරණ අවුරුදු මංගල්‍යයේදී නුවරවැව පවුලේ ප්‍රධානියාගේ වැඩි දායකත්වය ලැබෙන බව පෙනේ. සිංහල අලුත් අවුරුද්ද උදාවීමට පෙර නුවරවැව පවුලේ ප්‍රධානියාගේ සහභාගිත්වයෙන් පැවැත්වෙන අටමස්ථාන කමිටුවෙන් පරණ අවුරුදු මංගල්‍යය පවත්වන දිනය තීරණය කරනු ලැබේ. මහදුරයා විසින් ඒ බව විහාරගම්වල ජනතාවට දැනුම්දීමෙන් අනතුරුව ඔවුන් පැමිණ ශ්‍රී මහා බෝධි පරිශ්‍රයේ පිරිසිදු කිරීම, අලුත් වැලි ඇතිරීම ආදිය සිදුකෙරේ. පරණ අවුරුදු මංගල්‍යය පැවැත්වෙන සවස් භාගයේදී හේවිසි නාද මධ්‍යයේ ශ්‍රී මහා බෝධීන් වහන්සේට ගිලන්පස පූජා කිරීම සිදුකරනු ලබන්නේ අටමස්ථානාධිපති හිමියන් සහ නුවරවැව පවුලේ ප්‍රධානියා විසිනි. පිරිත් සජ්ඣායනා කිරීමෙන් උත්සවයේ වැඩ කටයුතු නිමාවට පත්වේ. පසුදින කිරිබත් පිස, රන් පාත්‍ර දෙකකට දමා ශ්‍රී මහා බෝධියටත්, රුවන්මැලිසෑයටත් පූජා කිරීම සිදුකෙරෙන බව මේ පිළිබඳ අධ්‍යයනයක නියැලුණු අනුරාධ සෙනෙවිරත්න සඳහන් කරයි (Seneviratna, 1994:209-210).

මේ හැරුණු විට හිටපු අටමස්ථාන ගිහි භාරකාර **මහින්ද බුලංකුලම** සමග කරන ලද සාකච්ඡාවකදී ඔහු සඳහන් කරන අන්දමට විශේෂ දිනවලදී ශ්‍රී මහා බෝධීන් වහන්සේට උදෑසන කිරි ආහාර පිළියෙල කොට පූජාකිරීමද නුවරවැව පවුලට පැවරී තිබෙන විශේෂ රාජකාරියකි. ඒ සඳහා සහල් සේරු එකහමාරක

කිරිබත් දැමිය හැකි පාරම්පරිකව පැවත එන රන් ආලේපිත පිත්තල පාත්‍රයක් යොදාගැනෙන අතර වී, කළු ඇට, කැඩුණු සහල් ආදිය ඉවත් කොට මෙම කිරිබත් පාත්‍රය පිළියෙල කරගනු ලැබේ (ජයසිංහ 2011).

වත්මන් නුවරවැව පවුලේ ප්‍රධානියා ලෙස අටමස්ථානයේ ගිහි භාරකාරීත්වය උසුලනු ලබන **ජනක අනුරාධ බුලංකුලම** විසින් දක්වන අන්දමට ඔහු වෙත ලැබිය යුතු නිසි පිළිගැනීම නොලැබීමේ හේතුවෙන් අර්බුදකාරී තත්ත්වයක් උදාවී තිබේ. ශ්‍රී මහා බෝධිය ආශ්‍රිතව සිදුකෙරන පාරම්පරික චාරිත්‍රවාරිත්‍ර නිසි පරිදි ඉටු නොවීම සහ අටමස්ථානයට සම්බන්ධයක් නොමැති පුද්ගලයන් ඒවා සඳහා මැදිහත්වී සිටීම ගැටළුසහගත බව ඔහුගේ අදහසයි. මෙහි ප්‍රතිඵලය වන්නේ තවත් වසර 10-15ක් පමණ ගතවන විට අටමස්ථානය හා සම්බන්ධ පාරම්පරික චාරිත්‍රවාරිත්‍ර අභාවයට යාම බව සඳහන් කරන වත්මන් අටමස්ථානයේ ගිහි භාරකරුගේ ඉල්ලීම වන්නේ මේ සියලු කටයුතු සිදුකිරීමේ බලය ඒ සඳහා පාරම්පරික උරුමය ඇති ඔහුට ලබාදෙන ලෙසයි (කුරුනේරු 2015).

**සමාලෝචනය**

අනුරාධපුර සමයේ දෙවනපෑතිස් රජ දවස දුමින්දාගමනය සමග පැමිණි බෝධිගුප්ත කුමරුට ධර්මාශෝක අධිරාජයා විසින් ශ්‍රී මහා බෝධියේ රැකවරණය පවරනු ලැබූ අතර දෙවනපෑතිස් රජු විසින් ජයමහලේනා තනතුර පවරමින් එකී කාර්යය තහවුරු කරනු කරන ලදී. එතැන් පටන් බෝධිගුප්ත පරපුර ස්වකීය කාර්යභාරය අඛණ්ඩව ඉටුකරනු ලැබූ අතර මහනුවර යුගයේදී එකී පරපුරට උරුමකම් කියනු ලැබුවේ නුවරකලාවියේ විසූ නුවරවැව පවුලයි. ඒ යටතේ ශ්‍රී මහා බෝධිය ප්‍රධාන අටමස්ථානයේ ගිහි භාරකාරීත්වය ද හිමිවූයේ එම පවුල වෙතටය. ඉංග්‍රීසි පාලන කාලයේදී නුවරවැව පවුලේ අවසන් උරුමකරු වූ නුවරවැව බංඩා අපුත්‍රකව මියයාමත් සමග නුවරවැව උරුමය පිළිබඳ අර්බුද ඇතිවුවද එය අවසානයේදී නුවරවැව බංඩාගේ වැන්දඹුව වූ ඕවිල්ලේ කුමාරිහාමිට හිමිව තිබේ. අනතුරුව ඕවිල්ලේ කුමාරිහාමිගේ දෙවැනි විවාහයෙන් 'බුලංකුලම' නමින් නාමකරණය වූ දරු පරපුර විසින් අද දක්වාම නුවරවැව පවුලේ ප්‍රධානියා වශයෙන් උරුමය පවත්වාගෙන එනු ලැබේ.

නුවරවැව පවුලේ ප්‍රධානියාට හිමිවන අයිතිවාසිකම් අතර විශේෂ තැනක් ගනු ලබන්නේ අටමස්ථානාධිපති හිමියන් තෝරාගැනීමට ඇති බලයයි. දිවයිනේ වෙනත් කිසිදු ගිහියෙකුට එලෙස නායක භික්ෂූන් වහන්සේ නමක් තෝරාගැනීමට කිසිදු බලයක් හිමිවී නොමැත. අනෙක් වැදගත් කරුණ නම් අටමස්ථානයේ ගිහි භාරකාරීත්වය සඳහා පාරම්පරිකව හිමිකම ලබාගැනීමත්, තමන්ට කැමති කාල

පරිච්ඡේදයක් ධූරය දැරීමත් ය. වර්තමානය වන විට ශ්‍රී මහා බෝධිය ආශ්‍රිත කටයුතු සඳහා බාහිර පුද්ගලයන් සම්බන්ධ වීම තුළින් පාරම්පරික චාරිත්‍ර වාරිත්‍ර පරිහානියට යමින් නුවරවැව පවුලේ ප්‍රධානියා සතු බලය හීනවීමක් දැකගත හැකිය.

## මූලාශ්‍ර

### සාහිත්‍ය මූලාශ්‍රය


*නිකාය සංග්‍රහය* (2008), සංස්. කෝන්ගස්තැන්නේ ආනන්ද හිමි, සමයවර්ධන පොත්හල, කොළඹ.

*නීති නිඝණ්ඩුව* (2009), සම්. සී.ජේ.ආර්.ලෙ. මෙසුරියර් සහ ටී.බී. පානබොක්කේ, පරි. අභය හේවාවසම්, සූරිය ප්‍රකාශකයෝ, කොළඹ.

*පූජාවලිය* (2009), සංස්. කිරිඇල්ලේ ඥාණවිමල හිමි, ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ.

*රාජරත්නාකරය* (1995), සංස්. කරුණාදාස රූපසිංහ, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.

*සිංහල බෝධිවංශය* (1970), සංස්. පුඤ්චිබණ්ඩාර සන්නස්ගල, ලේක්හවුස් මුද්‍රණාලය, කොළඹ.

*හරංකහවේ බුද්ධරක්ඛිත ස්වාමීන්ගේ පිංපොත* (2012), සම්. ආර්.ඩබ්ලිව්. ප්‍රියදර්ශන බණ්ඩාර, ශ්‍රී බෝධිරාජාරාම විහාරීය ප්‍රකාශන, අම්බරේගොඩ.

කරුණානන්ද, උක්කු බණ්ඩා (2007), *අනුරාධපුර අටමස්ථානය*, උරුමය අධ්‍යයන ආයතනය, පොල්ගස්ඕවිට.

කරුණානන්ද, උක්කු බණ්ඩා (2015), *නුවර කලාවියේ සමාජ සම්බන්ධතා 1815-1900*, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.

විමලානන්ද, තෙන්නකෝන් (2010අ), *උඩරට මහ කැරැල්ල 2*, ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ.

විමලානන්ද, තෙන්නකෝන් (2010)ආ, *උඩරට මහ කැරැල්ල-3*, ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ.

ස්වර්ණසිංහ, කේ.එම්.අයි. (2010), *අනුරාධපුර ජය ශ්‍රී මහා බෝධිය*, චාග ප්‍රකාශන, පන්නිපිටිය.

සිරිනිවාස හිමි, පල්ලේගම (2007), ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ ප්‍රමුඛ අටමස්ථානයේ භාරකාරත්වය, පරිපාලනය සහ පාරම්පරික සේවා දායකත්වය, *ජය සිරි මහ බෝ සිරිත*, රන්වැට අරමුදල, කොළඹ.

*D'Oyly's Diary* (1917), Ed. By. H.W.Codrington, Colombo Apothecaries Co. Ltd., Colombo.

Forbes, Major (1841), *Eleven Years in Ceylon-Vol. I*, Richard Bentley Publishers, London.

Hettiarachchi, S.B. (1994), Arrival of Bodhaharakulas-the Great Attempt to Indianize the Island, *Maha Bodhi Tree in Anuradhapura Sri Lanka*, Ed. By. H.S.S. Nissanka, Vikas Publishing House (Pvt.) Ltd., New Delhi.

Seneviratna, Anuradha (1994), Customs, Rituals and Traditions Grown Around the Maha Bodhi Tree in Anuradhapura, *Maha Bodhi Tree in Anuradhapura Sri Lanka*, Ed. H.S.S. Nissanka, Vikas Publishing House (Pvt.) Ltd., New Delhi.

Tennent, James Emerson (1860) *Ceylon*, Longman and Roberts, London.

Wright, Arnold (2004), *Twentieth Century Impressions of Ceylon*, Asian Educational Service, New Delhi.

**පුවත්පත් ලිපි**

කුරුනෙර්රු, පර්සි (2015), අටමස්ථානයේ ගිහි භාරකරුට දැන් පිළිගැනීමක් නෑ, *දිවයින*, මාර්තු 23.

ජයසිංහ, සකුන්තලා (2011), ජය සිරිමා බෝ හාමුදුරුවන්ට කැපවීම අපේ පරම්පරාවේ වගකීමක්, *දිනමිණ*, අප්‍රේල් 5.

පෙරේරා, සුනිල් සරත් (2012), සින්දුවෙන්ම එලොව ගිය මහවන්නියා, *දිනමිණ*, දෙසැම්බර් 07.

**අන්තර්ජාල මූලාශ්‍ර**

“**Bulankulame** Family History”, http://alfredratwattefamily.lk/FamilyHistoryBulan.html

“Bulankulame Walauwa”, http://www.srilankaheritages.com/heritage-balankulame.html

“The Sacred Bodhi-its arrival and thÈe connected with it”, http://www.defonseka.com/ k23.htm

**සම්මුඛ සාකච්ඡා**

උක්කු බණ්ඩා කරුණානන්ද, ජ්‍යෙෂ්ඨ මහාචාර්ය, ඉතිහාස අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය. 2016 ජනවාරි 12, 26, 28 පෙබරවාරි 2 යන දින.

**ඡායාරූප**

https://www.facebook.com/TheBulankulameFamily/

https://www.facebook.com/janaka.bulankulame

http://www.srilankaheritages.com/heritage-balankulame.html